# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1992 අංක 59 දරන
## සත්ව රෝග පනත

---

[සහතිකය සටහන් කළේ 1992 නොවැම්බර් මස 13 වන දින.]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1992 නොවැම්බර් මස 13 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල: රු. 2.10 යි. තැපැල් ගාස්තුව: රු. 1.55 යි.

# 1992 අංක 59 දරන සත්ව රෝග පනත

[සහතිකය සටහන් කළේ 1992 නොවැම්බර් මස 13 වන දින]

එල්: ඩී.—ඕ. 68/84

**සතුන්ගේ සංස්පර්ශක රෝග මර්දනය කිරීම හා වැළැක්වීම සඳහාත් සතුන්, සත්ව නිෂ්පාදන, පශු වෛද්‍ය ඖෂධ සහ පශු වෛද්‍ය ජෛව නිෂ්පාදන ආනයනය හා අපනයනය පාලනය කිරීම සඳහාත් ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහාත් විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1992 අංක 59 දරන සත්ව රෝග පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක සිට එය ක්‍රියාත්මක වන්නේ ය. **කෙටි නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය.**

## I වන කොටස

## පනත ක්‍රියාත්මක කිරීම

2. (1) මේ පනතේ කාර්ය සඳහා (මෙහි මින්මතු "අධ්‍යක්ෂවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) සත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය අධ්‍යක්ෂවරයා වශයෙන් හෝ සත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කිරීම සඳහා හෝ තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය. ඔහු මේ පනත පොදුවේ ක්‍රියාත්මක කිරීම භාරව සිටිය යුතු ය. **නිලධරයන් පත් කිරීම.**

(2) සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂවරයා 1956 අංක 46 දරන පශු වෛද්‍ය සහ පශු වෛද්‍ය වෘත්තික පනත යටතේ ලියාපදිංචි කරන ලද පශු වෛද්‍ය නිලධරයෙකු විය යුතු ය.

(3) සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් සහ සහකාර අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවක් ද මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ දී හෝ බල ගැන්වීමේ දී ඉහත කී නිලධරයාට සහායවීමේ කාර්යය සඳහා අවශ්‍ය වන වෙනත් නිලධරයන් සංඛ්‍යාවක් ද පත් කරනු ලැබිය හැකි ය.

(4) මේ පනත යටතේ අධ්‍යක්ෂවරයාගේ යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් අධ්‍යක්ෂවරයාගේ විධාන යටතේ යම් නියෝජ්‍ය අධ්‍යක්ෂවරයකු විසින් හෝ සහකාර අධ්‍යක්ෂවරයකු විසින් හෝ අධ්‍යක්ෂවරයාගේ අත්සන යටතේ තත් කාර්යය සඳහා ලියවිල්ලකින් බලය දෙන ලද වෙනත් නිලධරයකු විසින් හෝ ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම කළ හැකි ය.

## II වන කොටස

## මර්දනය කිරීම හා වැළැක්වීම

3. (1) ශ්‍රී ලංකාවට යම් සතකු ගෙන එන සෑම තැනැත්තකු විසින් එම සතා එසේ ගෙන එනු ලබන දින සිට දින හැටක කාල සීමාවක් ඇතුළත එම සතාට ඇති වන යම් රෝගී තත්ත්වයක් පිළිබඳව අධ්‍යක්ෂවරයාට දැනුම් දිය යුතු ය. **සත්ව රෝග මර්දනය කිරීම හා වැළැක්වීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරයාගේ බලතල.**

(2) (1) වන උපවගන්තියේ සඳහන් තැනැත්තකු හැර, තමන්ගේ සන්තකයේ හෝ තම පාලනය යටතේ යම් රෝගී සතකු සිටින සෑම තැනැත්තකු විසින් එම සතා වෙන් කර තැබිය යුතු අතර එම සතා රෝගීව සිටින බවට ළඟම සිටින පශු වෛද්‍ය නිලධරයාට නොපමාව දැන්වීමක් දිය යුතු ය. එවිට එම නිලධරයා විසින් නොපමාව ඒ බව අධ්‍යක්ෂවරයාට දැන්විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ හෝ (2) වන උපවගන්තිය යටතේ වූ දැන්වීමක් ලැබුණු විට, සතා පෙළෙන රෝගයේ සවභාවය තීරණය කිරීම සඳහා හා රෝගය ඇතිවී ඇති ස්ථානයට හෝ ප්‍රදේශයට රෝගය සීමා කිරීම සඳහා සහ එය පැතිරීම වැළැක්වීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගන්නා ලෙසට අධ්‍යක්ෂවරයා විසින් යම් බලයලත් නිලධරයකුට විශේෂ විධාන නිකුත් කළ හැකි ය.

ආසාදිත ස්ථාන සීමා තැබීම.

4. මෙහි පළමුවන උපලේඛනයේ සඳහන් (මෙහි මින් මතු "විශේෂිත රෝගය" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් සංස්පර්ශක රෝගයක් ඇති වී තිබෙන බවට තමාට තොරතුරු ලැබුණු විට හෝ පශු ශල්‍ය වෛද්‍යවරයකු විසින් තමා වෙත කරුණු ඉදිරිපත් කරනු ලැබූ විට, විශේෂිත රෝගය වැළැක්වීම හෝ එය පැතිරීමට ඇති ඉඩකඩ වැළක්වීම අවශ්‍ය යයි අධ්‍යක්ෂවරයා අදහස් කළ හොත් එම කාරණය මහේස්ත්‍රාත්වරයාට වාර්තා කළ යුතු ය. තවද එම නිලධරයා විසින් ඒ රෝගය වැළැක්වීමෙන් හෝ එය පැතිරීමට ඇති ඉඩකඩ වැළැක්වීම එම විශේෂිත රෝගය ඇති වී තිබෙන ස්ථානය හෝ එහි යම් කොටසක් නියමිත කාල සීමාවකට මුද්‍රා තැබීම සඳහා විධානයක් ලබා ගැනීමට ඉල්ලුම් කළ යුතු ය. විශේෂිත රෝගය වැළැක්වීම සඳහා හෝ එය පැතිරීමට ඇති ඉඩකඩ වැළැක්වීම සඳහා එම ස්ථානය මුද්‍රා තැබීම අවශ්‍ය යයි මහේස්ත්‍රාත්වරයා අදහස් කළ හොත් මහේස්ත්‍රාත්වරයා විසින් අවස්ථාගත කරුණු අනුව සුදුසු යයි ඔහු අදහස් කරන විධාන කළ යුතු ය.

ආසාදිත ප්‍රදේශ සීමා තැබීම.

5. (1) යම් ආසාදිත ස්ථානයක් මුද්‍රා තැබීම පිණිස විධාන ලබා ගැනීමට අතිරේකව ආසාදිත ස්ථානය ද ඇතුළුව යම් ප්‍රදේශයක්, ආසාදිත ප්‍රදේශයක් ලෙස ප්‍රකාශ කිරීම යෝග්‍ය යයි අධ්‍යක්ෂවරයා විසින් සලකනු ලැබුවහොත් අධ්‍යක්ෂවරයා විසින් එම ස්ථානයේ හෝ ප්‍රදේශයේ ප්‍රකටව පෙනෙන ස්ථානයක ඒ බවට දැන්වීමක් ඇලවීමෙන් මාස තුනකට නොවැඩි කාලයක් සඳහා එම ස්ථානය ද ඇතුළු එම ප්‍රදේශය එසේ ආසාදිත ප්‍රදේශයක් ලෙස, ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් ප්‍රකාශයට පත් කළ හැකි ය.

(2) ආසාදිත සතාගේ වර්ගය, විශේෂිත රෝගයේ ස්වභාවය, එම රෝගය ඇති වී ඇති ස්ථානය හා ප්‍රදේශයේ සීමා සහ එම නියමය ක්‍රියාත්මක වන්නේ කවර දිනයක සිට ද යන වග එවැනි සෑම නියමයකම නිශ්චිතව සඳහන් විය යුතු ය.

(3) අධ්‍යක්ෂවරයා විසින්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන එවැනි නියමයක් මගින් එම කාල සීමාව මාස හයක් නොඉක්මවන වැඩිදුර කාල සීමාවකට දීර්ඝ කළ හැකි ය.

(4) යම් ස්ථානයක් මුද්‍රා තබනු ලැබූ හෝ යම් ප්‍රදේශයක් ආසාදිත ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති අවස්ථාවක, එම ස්ථානය හෝ ප්‍රදේශය ආසාදනයෙන් තොර බවට අධ්‍යක්ෂවරයා විසින් කරනු ලැබ, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ, නියමයක් මඟින් ප්‍රකාශයට පත් කරනු ලබන තෙක්, පශු ශල්‍ය වෛද්‍යවරයා විසින් අත්සන් කරන ලද අවසර පත්‍රයක් නොමැතිව, කිසිම සතකු හෝ සත්ව මළ කුණක් හෝ එහි යම් කොටසක් හෝ යම් මලද්‍රව්‍ය, සත්ව නිෂ්පාදන, අතුරුණු, තණකොළ, වියළුනු තණකොළ හෝ පිදුරු හෝ වෙනත් යම් දෙයක් එම ස්ථානයෙන් හෝ ප්‍රදේශයෙන් පිටතට ගෙන යාම නොකළ යුතු ය.

6. (1) යම් පාරක් හෝ එහි යම් කොටසක් ආසාදිත ප්‍රදේශයක් බව ද එය 5 වන වගන්තිය යටතේ වූ දැන්වීමක නිශ්චිතව සඳහන් වර්ගයේ සතුන්, එම දැන්වීමේ නිශ්චිතව සඳහන් කාලසීමාව ඇතුළත ඒ පාර ඔස්සේ හෝ ඒ කොටස ඔස්සේ ප්‍රවාහනය කිරීම තහනම් කර ඇති බව ද එම පාරේ හෝ ඒ කොටසේ ප්‍රකටව පෙනෙන ස්ථානවල දැන්වීම් ඇලවීමෙන් හෝ සුදුසු යයි අධ්‍යක්ෂවරයා අදහස් කරන වෙනත් ආකාරයකින් අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කිරීම නීත්‍යනුකූල වන්නේ ය. සතුන් ප්‍රවාහනය කළ නොහැකි පරිදි පාරවල් වසා තැබීම.

(2) (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් අලවනු ලැබ ඇති අවස්ථාවක එම පාර ඔස්සේ හෝ ඒ කොටස ඔස්සේ, එසේ නිශ්චිතව සඳහන් කර ඇති කාලසීමාව තුළ කිසිම තැනැත්තකු විසින් එම දැන්වීමේ නිශ්චිතව සඳහන් යම් සතකු, ප්‍රවාහනය කිරීම සඳහා හෝ වෙනත් කාර්යයක් සඳහා ගෙන යාම නොකළ යුතු ය.

(3) මේ වගන්තියේ (1) වන සහ (2) වන උපවගන්තිවල විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා යම් පාරක හෝ එහි යම් කොටසක, අධ්‍යක්ෂවරයා විසින් තීරණය කරනු ලබන, ස්ථානවල බාධක යෙදවීම බලයලත් නිලධරයකුගේ වගකීම වන්නේ ය.

7. (1) 5 වන වගන්තිය යටතේ වූ නියමයක් මඟින් යම් ප්‍රදේශයක් ආසාදිත ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති අවස්ථාවක, එම නියමයේ විශේෂිත සඳහන් වර්ගයට අයත් වූ ද එම නියමය අදාළ වන ප්‍රදේශයේ සිටින්නා වූ ද සෑම සතකුම, දැන්වීමේ නිශ්චිතව සඳහන් වේලාවේ දී හා ස්ථානයේ දී, එම නියමයේ දක්වා ඇති විශේෂිත රෝගයට එරෙහිව ප්‍රතිශක්තිකරණය කිරීම සඳහා එම සතාගේ අයිතිකරු විසින් ඉදිරිපත් කළ යුතු බව ලියවිල්ලකින් වූ දැන්වීමක් මඟින් අධ්‍යක්ෂවරයා විසින් නියම කිරීම නීත්‍යනුකූල වන්නේ ය. ආසාදිත ප්‍රදේශයක් තුළ සතුන්ට ප්‍රතිශක්තිකරණය ලබාදීම.

(2) (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් නිකුත් කරන ලද අවස්ථාවක, එම දැන්වීමේ විස්තර කර ඇති වර්ගයේ සතකුගේ අයිතිකරු විසින් එම දැන්වීමේ නියමයන්ට අනුකූලව ක්‍රියා කළ යුතුය.

ආසාදිත සතුන් සහ මළකුණු තහනමට ගැනීම.

8. 5 වන වගන්තිය යටතේ වූ නියමයේ දක්වා ඇති විශේෂිත රෝගයේ ස්වභාවය හා එය පැතිරීමේ ඉඩකඩ සැලකිල්ලට ගෙන, 5 වන වගන්තිය යටතේ වූ නියමය අදාල වන වර්ගයට අයත් වූ ද එම නියමයේ විශේෂිත සඳහන් ප්‍රදේශය තුළ සිටින්නා වූ ද රෝගී සතාගෙන් හෝ උගේ මළකුණෙන් ආසාදිත හෝ උගේ හෝ උගේ මළකුණේ ස්පර්ශය ලත් යම් සතකු තහනමට ගෙන රඳවා තබන ලෙස අධ්‍යක්ෂවරයා විසින් නියම කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

රෝගී සතාගෙන් ආසාදිත හෝ උගේ ස්පර්ශය ලත් සතකු විනාශ කිරීම සහ බැහැර කිරීම.

9. (1) 8 වන වගන්තිය යටතේ තහනමට ගනු ලැබූ හෝ රඳවා ගනු ලැබූ සතකු විනාශ කර, බැහැර කළ යුතු බව අධ්‍යක්ෂවරයාගේ මතය වුවහොත් අධ්‍යක්ෂවරයා විසින් හෝ බලයලත් නිලධරයා විසින් එම කාරණය මහෙස්ත්‍රාත්වරයාට වාර්තා කර සතා විනාශ කිරීම සඳහා සහ උගේ මළකුණ බැහැර කිරීම සඳහා සහ යම් ආසාදිත ද්‍රව්‍ය විනාශ කර, බැහැර කිරීම සඳහා විධානයක් කරන ලෙස ඉල්ලුම් කළ යුතු අතර එසේ විනාශ කර බැහැර කිරීම විශේෂිත රෝගය වැළැක්වීම පිණිස හෝ එය පැතිරීමට ඇති අවස්ථා වැළැක්වීම පිණිස හිතකර වන බව මහෙස්ත්‍රාත්වරයාගේ මතය වේ නම්, අවස්ථාගත කරුණු අනුව සුදුසු යයි ඔහු අදහස් කරන විධාන මහේස්ත්‍රාත්වරයා විසින් කළ යුතු ය.

මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කරනු ලබන වාර්තාවෙහි විධානය අපේක්ෂා කරනු ලබන්නේ යම් විෂය කරුණක් සම්බන්ධයෙන් ද ඒ විෂය කරුණ පිළිබඳව ප්‍රමාණවත් විස්තර දිය යුතු අතර එය පශුශල්‍ය වෛද්‍යවරයකුගේ සහතිකයකින් සනාථ කර තිබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නියම කර ඇති පරිදි සතා විනාශ කර, උගේ මළකුණ බැහැර කිරීම සහ යම් ආසාදිත ද්‍රව්‍යයක් විනාශ කර බැහැර කිරීම නියමිත ආකාරයට සිදු කෙරෙන බවට වග බලා ගැනීම බලයලත් නිලධරයාගේ කාර්යය වන්නේ ය.

සත්ව නිෂ්පාදන ආදිය තහනමට ගැනීම.

10. නිශ්චිත රෝගයේ ස්වභාවය සහ එය පැතිරීමට ඇති ඉඩකඩ සැලකිල්ලට ගෙන, 5 වන වගන්තිය යටතේ වූ නියමයක සඳහන් ප්‍රදේශයක සිට හමුවන සහ එම නියමය අදාල වන වර්ගයේ සතුන්ගේ සත්ව නිෂ්පාදන තහනමට ගන්නා ලෙස අධ්‍යක්ෂවරයා විසින් නියම කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

සත්ව නිෂ්පාදන විනාශ කර බැහැර කිරීම.

11. (1) අධ්‍යක්ෂවරයා විසින් හෝ බලයලත් නිලධරයා විසින් 10 වන වගන්තිය යටතේ තහනමට ගැනීම මහෙස්ත්‍රාත්වරයාට වාර්තා කළ යුතු අතර එසේ තහනමට ගනු ලැද යම් සත්ව නිෂ්පාදනය විනාශ කර, බැහැර කිරීම සඳහා විධානයක් කරන ලෙස මහෙස්ත්‍රාත්වරයාගෙන් ඉල්ලුම් කළ යුතු ය. එසේ විනාශ කර බැහැර කිරීම විශේෂිත රෝගය වැළැක්වීම පිණිස හෝ එය පැතිරීමේ ඉඩකඩ වැළැක්වීම පිණිස හිතකර වන බව මහෙස්ත්‍රාත්වරයාගේ මතය වේ නම්, අවස්ථාගත කරුණු අනුව සුදුසු යයි ඔහු අදහස් කරන විධාන මහෙස්ත්‍රාත්වරයා

විසින් කළ යුතු ය. රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කරනු ලබන වාර්තාවෙහි විධානය අපේක්ෂා කරනු ලබන්නේ යම් විෂය කරුණක් සම්බන්ධයෙන් ද, ඒ විෂය කරුණ පිළිබඳව ප්‍රමාණවත් විස්තර ඇතුලත් විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ විනාශ කරන ලෙස නියම කරන ලද යම් සතකුගේ මස්, මස් නිෂ්පාදන හෝ අතුරු නිෂ්පාදන විනාශ කිරීම හෝ බැහැර කිරීම නියමිත ආකාරයට සිදුවන බවට වගබලාගැනීම බලයලත් නිලධරයාගේ කාර්යය වන්නේ ය.

12. (1) ගොඩනැගිලි, වාහන, උපකරණ සහ යන්ත්‍ර සූත්‍ර (ඉන්කියුබේටර්) ඇතුලුව යම් විශේෂිත රෝගයක් ඇති වී තිබෙන සියලු ස්ථාන, පශු ශල්‍ය වෛද්‍යවරයකුගේ අධීක්ෂණය යටතේ, නියමිත ආකාරයෙන් විෂබීජ නාශනයට භාජනය කරනු ලැබිය යුතු ය. විෂබීජ නාශනය.

(2) විෂබීජ නාශකය නියමිත ආකාරයෙන් කරනු ලබන බවට වගබලා ගැනීම පශු ශල්‍ය වෛද්‍යවරයාගේ යුතුකම වන්නේ ය.

13. (1) බලයලත් නිලධරයකු විසින්— බලයලත් නිලධරයාගේ බලතල.

(අ) මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ තම කර්තව්‍ය ඉටු කිරීමේ දී, අධ්‍යක්ෂවරයාට කලින් දැනුම්දීමක් කිරීමෙන් පසුව, දවසේ යම් සාධාරණ වේලාවක දී යම් ස්ථානයකට ඇතුල්විය හැකි ය.

(ආ) මේ පනත යටතේ තම බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට හා ඉටු කිරීමට සම්බන්ධ වූ හෝ එසේ ක්‍රියාත්මක කිරීම සඳහා හෝ ඉටුකිරීම සඳහා වෙනත් යම් ක්‍රියාවක් කළ හැකි ය.

(2) යම් බලයලත් නිලධරයකු (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ අධ්‍යක්ෂවරයාට කලින් දැනුම්දීමක් නොකර ක්‍රියා කළහොත් හෝ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ ක්‍රියා කළහොත් ඔහු විසින් නොපමාවම එම ක්‍රියාව පිළිබඳව අධ්‍යක්ෂවරයාට දැනුම් දිය යුතු අතර එම ක්‍රියාව කිරීමට හේතු ද සඳහන් කළ යුතු ය.

(3) මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද නියෝග යටතේ වූ තම බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා, බලයලත් නිලධරයකුට කිසිම තැනැත්තකු විසින් බාධා නොකළ යුතු ය.

14. (1) යම් නිශ්චිත රෝගයක් වැළඳී තිබේදැයි සත්‍ය වශයෙන් දැන ගැනීම සඳහා පරීක්ෂණයක් පැවැත්වීම පිණිස, බලයලත් නිලධරයාට— නිශ්චිත රෝග වැළඳී තිබේදැයි බැලීම සඳහා සතුන් පරීක්ෂා කර බැලීම.

(අ) යම් ගොවිපළකට, ගව මඩුවකට, කුකුල් කොටුවකට, බිජ රක්කවන ස්ථානයකට, හෝ යම් සතකු තබාගෙන ඇති හෝ ඇති කරනු ලබන හෝ යම් සත්ව නිෂ්පාදනයක් තබාගෙන ඇති වෙනත් යම් ස්ථානයකට ඇතුල්වීම ; සහ

(ආ) නිශ්චිතව සඳහන් දිනයක නිශ්චිතව සඳහන් වේලාවකදී යම ස්ථානයක දී එම සතා හෝ යම් නිෂ්පාදන ඉදිරිපත් කරන ලෙස එම සතාගේ හෝ සත්ව නිෂ්පාදනයේ අයිතිකරුට නියම කිරීම

කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරන ලද පරීක්ෂණයක දී රෝගයකින් පෙළෙන බව දක්වන සෑම සතකු ම, සියලුම ආසාදිත ද්‍රව්‍ය සමග විනාශ කර, ඉවත් කළ යුතු අතර 9 වන වගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

(3) එම සතා සහ යම් ආසාදිත ද්‍රව්‍ය නියමිත ආකාරයෙන් විනාශ කර බැහැර කරන බවට වගබලා ගැනීම බලයලත් නිලධරයාගේ කාර්යය වන්නේ ය.

(4) මේ වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ යම් සතකු විනාශ කර බැහැර කිරීම සඳහා මහෙස්ත්‍රාත්වරයා විසින් විධානයක් කරන ලද අවස්ථාවක, මහෙස්ත්‍රාත්වරයා විසින් කරන ලද විධානය බලපෑ තැනැත්තාට අධ්‍යක්ෂවරයා විසින් මුදලක් ගෙවීම සාධාරණ සහ යුක්තිසහගත යයි, අවස්ථාගත කරුණු අනුව, මහෙස්ත්‍රාත්වරයා අදහස් කළහොත්, ඔහු විසින් තීරණය කරනු ලබන මුදලක් ගෙවන ලෙස ආඥා කළ යුතු ය.

*සතුන් සහ සත්ව නිෂ්පාදන විකිණීම.*

15. (1) (අ) 12 වන වගන්තිය යටතේ විෂබීජ නාශනය කරන ලද යම් ස්ථානයක ඇති සතුන් සහ සත්ව නිෂ්පාදන එකී විෂබීජ නාශන කරන ලද දිනයේ සිට දින තිහක් වූ කාල සීමාවක් තුළ විකිණීම ;

(ආ) ආසාදිත ප්‍රදේශයේ වෙළඳපොළවල, විකුණුම් අංගනවල සහ වෙනත් යම් ස්ථානයක රෝගී සතුන් විකිණීම සහ ප්‍රදර්ශනය කර තැබීම

අධ්‍යක්ෂවරයා විසින් තහනම් කරනු ලැබීම නීත්‍යානුකූල වන්නේ ය.

(2) සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි ප්‍රවෘත්ති පත්‍රයක දැන්වීමක් පළ කිරීමෙන් සහ ආසාදිත ප්‍රදේශයේ යම් ප්‍රකටව පෙනෙන ස්ථානයක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමෙන් (1) වන උපවගන්තිය යටතේ වූ තහනම පිළිබඳව මහජනයාට නිවේදනය කළ යුතු ය.

*සත්ව සායන, සතුන් බෝ කරන ස්ථාන ආදී වශයෙන් ස්ථාන ලියාපදිංචි කිරීම.*

16. (1) යම් තැනැත්තකු විසින්, සත්ව සායනයක්, සත්ව නිවසක් හෝ බීජ මගින් බෝ කරන ස්ථානයක් වශයෙන් යම් ස්ථානයක් ලියාපදිංචි කිරීම සඳහා නියමිත ආකාරයෙන් ලියවිල්ලකින් වූ ඉල්ලුම් පත්‍රයක් අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කර ඒ සඳහා අනුමතය ලබාගනු ලැබුවහොත් හැර, ඒ තැනැත්තා විසින් ඒ ස්ථානය එසේ සත්ව සායනයක්, සත්ව නිවසක් හෝ බීජ මගින් බෝ කරන ස්ථානයක් ලෙස පාවිච්චි නොකළ යුතු ය.

(2) එම ස්ථානයේ අයිතිකරු හෝ එම ස්ථානය භාරව සිටින තැනැත්තා විසින් කරන ලද ලිඛිත ඉල්ලීමක් මත, එම ස්ථානය පිහිටි ප්‍රදේශයේ පශු ශල්‍ය වෛද්‍යවරයා විසින් නිකුත් කරන ලද සහතිකයක් එවැනි සෑම ඉල්ලුම්පත්‍රයක් සමගම, ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර එම සහතිකය නිකුත් කිරීමට පෙර එම ස්ථානයට ගොස් එම ස්ථානය පරීක්ෂා කිරීම පශු ශල්‍ය වෛද්‍යවරයාගේ කාර්යය වන්නේ ය.

(3) එම ස්ථානයේ කටයුතු නිසි ලෙස සිදු කරනු ලබන බව සහ එම ස්ථානය නිසි ලෙස කළමනාකරණය කරනු ලබන බව ස්ථිර වන පරිදි එම ස්ථානයේ—

(i) ප්‍රමාණවත් පහසුකම්;

(ii) ආරක්ෂා විධිවිධාන; සහ

(iii) පුහුණු වූ සහ පළපුරුදු සේවක පිරිසක්

ඇති බවට ප්‍රකාශයක් (2) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලබන සහතිකයේ අඩංගු විය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ ඉල්ලුම් පත්‍රයක් ලැබුණු විට, ඉල්ලුම්පත්‍රයේ අඩංගු විස්තර සත්‍ය බවට, නිවැරදි බවට පශු ශල්‍ය වෛද්‍ය නිලධරයා විසින් නිකුත් කරන ලද සහතිකය පිළිබඳව අධ්‍යක්ෂවරයා සෑහීමට පත් වුවහොත්, ඔහු විසින් එම ස්ථානය ලියාපදිංචි කළ යුතු ය.

(5) එසේ කරන ලද ලියාපදිංචිය, එම ලියාපදිංචි කිරීමේ දින සිට අවුරුදු එකක් වූ කාලයක් වලංගුව පැවතිය යුතු අතර, එය අලුත් කිරීම සඳහා ඉල්ලුම් කරන ලද විට එය අලුත් කරනු ලැබිය හැකි වන්නේ ය.

(6) එම ස්ථානයට ගොස් පරීක්ෂා කිරීම යෝග්‍ය යයි අධ්‍යක්ෂවරයා හෝ ඔහු විසින් බලය දෙන ලද යම් නිලධරයකු සලකන කවර අවස්ථාවක වුව ද, ඒ අධ්‍යක්ෂවරයා හෝ ඒ නිලධරයා එහි ගොස් ඒ ස්ථානය පරීක්ෂා කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

17. (1) අධ්‍යක්ෂවරයා විසින් ඒ කාර්යය සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක බලය යටතේ මිස කිසිම තැනැත්තකු විසින් යම් පශු වෛද්‍ය ඖෂධයක් හෝ පශු වෛද්‍ය ජෛව නිෂ්පාදනයක් ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය නොකළ යුතු ය. පශු වෛද්‍ය ඖෂධ සහ පශු වෛද්‍ය ජෛව නිෂ්පාදනය කිරීම සහ ඒ සඳහා බලපත්‍ර නිකුත් කිරීම.

(2) එවැනි බලපත්‍රයක් ලබා ගැනීමට අදහස් කරන සෑම තැනැත්තකු ම විසින් ඒ සඳහා නියමිත ආකාරයෙන් අධ්‍යක්ෂවරයා වෙත ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ යුතු අතර නියම කරනු ලබන ගාස්තුව ද ඒ සමග ඉදිරිපත් කළ යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ වූ සෑම ඉල්ලුම් පත්‍රයක් ම, අවශ්‍යාවෝචිත පරිදි එක් එක් පශු වෛද්‍ය ඖෂධය හෝ පශු වෛද්‍ය ජෛව නිෂ්පාදනය සම්බන්ධයෙන් වෙන වෙනම ඉදිරිපත් කළ යුතු ය.

(4) (2) වන උපවගන්තිය යටතේ ඉල්ලුම් පත්‍රයක් ලැබුණු විට—

(අ) පහත සඳහන් කරුණු ගැන, එනම් :—

(i) එම ඉල්ලුම්පත්‍රය (2) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව ඉදිරිපත් කරනු ලැබ ඇති බවට සහ එම ඉල්ලුම්පත්‍රයේ අඩංගු විස්තර සත්‍ය බවට හා නිවැරදි බවට ;

(ii) එකී නිෂ්පාදනය කිරීම සඳහා භාවිත කරනු ලබන ස්ථානය සහ එහි උපකරණ නියමිත ප්‍රමිතිවලට අනුකූල වන බවට ; සහ

(iii) එකී නිෂ්පාදනය කිරීම භාරව සිටින තැනැත්තා නියමිත පුහුණුව සහ පළපුරුද්ද ලබා ඇති බවට

අධ්‍යක්ෂවරයා සෑහීමට පත් වුවහොත් ඔහු විසින් බලපත්‍රයක් නිකුත් කළ යුතු ය;

(ආ) අධ්‍යක්ෂවරයා එසේ සෑහීමට පත් නොවුවහොත් ඔහු විසින් එම ඉල්ලුම්පත්‍රය ඉවත දැමිය යුතු ය.

බලපත්‍රයේ වලංගුභාවය.

18. (1) 17 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් කලින් අවලංගු කරනු ලැබුවහොත් හෝ අත්හිටවනු ලැබුවහොත් මිස, එය නිකුත් කරන ලද දින සිට අවුරුදු එකක කාලසීමාවක් වලංගු වන්නේ ය.

(2) මේ පනතේ හෝ එය යටතේ සාදන ලද නියෝගයක යම් විධිවිධානයක් නිෂ්පාදකයා විසින් උල්ලංඝනය කරනු ලැබ ඇති බවට අධ්‍යක්ෂවරයා සෑහීමට පත් වුවහොත්, තමා විසින් නිකුත් කරන ලද යම් බලපත්‍රයක් අවලංගු කිරීම හෝ අත්හිටුවීම අධ්‍යක්ෂවරයා විසින් කළ හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ වූ නියමයක් නොකිරීමට හේතු තිබේ නම්, ඒ හේතු දැක්වීමේ නිශ්චිතව සඳහන් කාලසීමාව ඇතුළත පෙන්වන ලෙසට බලපත්‍රධාරියාට දැන්වීමක් කිරීමෙන් පසුව හැර සහ එම කාලසීමාව ඇතුළත ඔහු විසින් හේතු පෙන්වීම පැහැර හැරියහොත් හෝ ඔහු විසින් ප්‍රමාණවත් හේතු පෙන්වනු නොලැබුවහොත් හැර, ඒ නියමය නොකළ යුතු ය.

(4) 17 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ ඉල්ලුම්පත්‍රයක් ඉවත දැමීම නිසා හෝ මේ වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ බලපත්‍රයක් අවලංගු කිරීම හෝ අත්හිටුවීම නිසා අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, තමාට එම තීරණය දැනුම් දෙනු ලැබූ දින සිට දින දහහතරක කාලසීමාවක් ඇතුළත අවස්ථාවෝචිත පරිදි, එකී ඉවත දැමීමට, අවලංගු කිරීමට හෝ අත්හිටුවීමට විරුද්ධව අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ලියවිල්ලකින් අභියාචනයක් ඉදිරිපත් කළ හැකි අතර තමා වෙත ඉදිරිපත් කරන ලද අභියාචනයක් ගැන ක්‍රියා කිරීමේ දී, ලේකම්වරයා විසින් එම අභියාචනයට විෂය වූ නියමය ස්ථිර කිරීම, වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම හෝ කළ හැකි ය.

(5) එවැනි අභියාචනයක් සම්බන්ධයෙන් ලේකම්වරයාගේ තීරණය අවසාන හා තීරණාත්මක වන්නේ ය.

19. අධ්‍යක්ෂවරයා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක බලය යටතේ මිස, කිසිම තැනැත්තකු විසින්— පට්ටි ගොනුන් සහ ප්‍රදානකාරක එළදෙනුන් සඳහා බලපත්‍ර ලබාගත යුතු බව.

(අ) අභිජනනය පිණිස ශුක්‍ර එකතු කිරීම, සකස් කිරීම සහ යොදා ගැනීම සඳහා පට්ටි ගොනකු; හෝ

(ආ) කලල රූප රෝපනය පිණිස කලල රූප නිපදවීමේ කාර්යය සඳහා ප්‍රදානකාරක එළදෙනකු

තබාගැනීම හෝ නඩත්තු කිරීම නොකළ යුතු ය.

20. බලයලත් නිලධරයකු විසින් නිකුත් කරන ලද පරීක්ෂණ වාර්තාවක් අනුව අවශ්‍යතාවෝචිත පරිදි ගොනා හෝ දායක දෙන සෞඛ්‍ය සම්පන්න බවට ද යම් විශේෂිත රෝගයකින් නොපෙළෙන බවට ද විශේෂයෙන්ම බෲසෙල්ලෝසිස්, විබ්‍රියෝසිස්, ට්‍රයිකොමොනාසිස් හෝ වෙනත් නියමිත රෝගයකින් ආසාදිත නොවන බවට අධ්‍යක්ෂවරයා සෑහීමට පත් වුවහොත් ඔහු විසින් එම බලපත්‍රය නිකුත් කළ යුතු ය. බලපත්‍රය නිකුත් කිරීමට පෙර පරීක්ෂණ වාර්තාව.

## III වන කොටස

### සතුන් සහ සත්ව නිෂ්පාදන, පශු වෛද්‍ය ඖෂධ සහ පශු වෛද්‍ය ජෛව නිෂ්පාදන ආනයනය කිරීම හා අපනයනය කිරීම

21. (1) අධ්‍යක්ෂවරයාගේ නිර්දේශය මත, ආනයන සහ අපනයන පාලකවරයා විසින් නිකුත් කරන ලද අවසර පත්‍රයක බලය යටතේ හැර, කිසිම තැනැත්තකු විසින් යම් සතකු, සත්ව නිෂ්පාදනයක්, පශු වෛද්‍ය ඖෂධයක්, පශු වෛද්‍ය ජෛව නිෂ්පාදනයක්, සත්ව ශුක්‍ර හෝ කලල රූප ආනයනය නොකළ යුතු ය. අවසර පත්‍රයක් නොමැතිව ආනයනය කිරීම තහනම් බව.

(2) එවැනි ආනයනය කිරීමක් නිර්දේශ කරනු ලැබ ඇති අවස්ථාවක, අධ්‍යක්ෂවරයා විසින් ඇතුළුවීමේ වරාය සඳහන් කළ යුතු ය.

22. (1) සත්ව නිෂ්පාදනය, සතුන් තුළ රෝග ඇති කිරීමට ඉඩ ඇති යම් ආසාදන ද්‍රව්‍යයකින් තොර බව ප්‍රකාශ කරමින් එම සත්ව නිෂ්පාදනයක් ගෙන්වනු ලබන්නේ යම් රටකින් ද, ඒ රටේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධරයා විසින් හෝ ඔහු විසින් බලය දෙන ලද පශු වෛද්‍ය නිලධරයකු විසින් දෙන ලද සහතිකයක්, ආනයනකරු විසින් ඉදිරිපත් කරනු ලැබුවහොත් මිස, ඒ නිෂ්පාදනය ආනයනය කිරීම සඳහා බලපත්‍රයක් නිකුත් කිරීමට අධ්‍යක්ෂවරයා විසින් නිර්දේශයක් නොකළ යුතු ය. සත්ව නිෂ්පාදන ආනයනය කිරීම සඳහා අවසර පත්‍ර නිකුත් කිරීම.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ සහතිකය මෙහි දෙවන උපලේඛනයේ දක්වා ඇති ආකෘතිය අනුව විය යුතු ය.

(3) සත්ව නිෂ්පාදනය, ඇතුළුවීමේ වරායට ළඟාවන දිනය පිළිබඳ දැන්වීමක්, එම නිෂ්පාදනය එසේ ළඟාවන දිනයට දින හතකට පෙර, ආනයනකරු විසින් අධ්‍යක්ෂවරයාට හෝ ඔහු විසින් බලය දෙන ලද නිලධරයකුට දිය යුතු ය.

*යම් වරායක් හෝ ස්ථානයක් රෝගයකින් ආසාදිත බව ප්‍රකාශ කිරීමට අමාත්‍යවරයාට ඇති බලය.*

23. (1) වරාය හා නාවික විෂයය භාර අමාත්‍යවරයා සමඟ, අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත යම් වරායක් හෝ ස්ථානයක් සත්ව රෝගයකින් ආසාදිත ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කළ හැකි ය.

(2) සත්ව රෝගයකින් ආසාදිත ප්‍රදේශයක් ලෙස (1) වන උපවගන්තිය යටතේ ප්‍රකාශයට පත් කරන ලද යම් වරායකින් හෝ ස්ථානයකින් යම් සතකු හෝ සත්ව නිෂ්පාදනයක් ආනයනය කිරීම සඳහා කිසිම තැනැත්තකුට අවසර පත්‍රයක් නිකුත් කරනු නොලැබිය යුතු ය.

*යම් ආසාදිත හෝ රෝගී සතකු ගෙන එන නෞකාවලට ඇතුල් වීමට ඉඩදීම ප්‍රතික්ෂේප කිරීම සඳහා වරාය රේඛාධිපතියාට ඇති බලය.*

24. 23 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සත්ව රෝගයකින් ආසාදිත ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබුවා වූ ද ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටියා වූ ද යම් වරායක හෝ ස්ථානයක සිට සතුන් ගෙන එන යම් නැවක යම් ආසාදිත සතුන් හෝ රෝගයකින් පෙළෙන යම් සතකු සිටින බවට උචිත බලධරයා සෑහීමට පත් වුවහොත්, එම නැවට ඇතුළුවීමට අවසර දීම උචිත බලධරයා විසින් ප්‍රතික්ෂේප කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

*ආනයනකරු විසින් නෞකාව පැමිණීම ගැන දැනුම් දීම.*

25. (1) ශ්‍රී ලංකාවට සතකු ආනයනය කරන සෑම තැනැත්තකු ම විසින් එම සතා ගෙන එන නැව පැමිණෙන දිනය හා වේලාව පිළිබඳව වූ පූර්ව දැනුම්දීමක් අධ්‍යක්ෂවරයාට හෝ ඒ සඳහා අධ්‍යක්ෂවරයා විසින් බලය දෙන ලද නිලධරයකුට දිය යුතු ය.

(2) එම දැන්වීම දිය යුත්තේ කවර කාල සීමාවකට පෙර ද යන වග අධ්‍යක්ෂවරයා විසින් අවසර පත්‍රය නිකුත් කිරීම සඳහා වූ නිර්දේශයේ නිශ්චිතව සඳහන් කළ යුතු ය.

*සෞඛ්‍ය සහතිකය.*

26. (1) සතකු ගෙන්වනු ලබන්නේ යම් රටකින් ද, ඒ රටේ ප්‍රධාන පශු ශල්‍ය වෛද්‍යවරයාගෙන් හෝ බලයලත් පශු ශල්‍ය වෛද්‍යවරයාගෙන් මෙහි පහත දැක්වෙන කරුණු සඳහන් කරමින් ලබාගත් සහතිකයක් ආනයනකරු විසින් අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කළහොත් මිස, ඒ සතා ශ්‍රී ලංකාවට ආනයනය කිරීම සඳහා කිසිම අවසරපත්‍රයක් අධ්‍යක්ෂවරයා විසින් නිර්දේශ නොකළ යුතු ය:—

(අ) සතා ගෙන්වනු ලබන්නේ යම් රටකින් ද, ඒ රට;

(ආ) සතා රෝගයකින් නොපෙළෙන බව හා සතා අපනයනය කිරීමට පෙරාතුව වූ මාස තුනක කාලසීමාවක් තුළ සතා රෝගයකින් නොපෙළුණු බව හා රෝගී සතුන් හා සම්බන්ධ වී නොසිටි බව;

(ඇ) සතා ගෙන යන නැව පිටවන වරායෙන් පිටත්වීමට පෙරාතුව වූ මාස තුනක කාලය තුළ සතා ගෙන්වනු ලබන්නේ යම් ස්ථානයකින් ද, ඒ ස්ථානය රෝගවලින් තොරව පැවති බව ; සහ

(ඈ) විශේෂිත රෝගවලට එරෙහිව සතා ප්‍රතිශක්තිකරණය කරනු ලැබ ඇති බව.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ සහතිකය මෙහි තුන්වන උපලේඛනයේ දක්වා ඇති ආකෘතිය අනුව විය යුතු ය.

27. බලයලත් නිලධරයා නැවට නැග, එහි ඇති සතුන් පරීක්ෂා කර, එම සතුන් හෝ එහි ඇති නැව් බඩු ගොඩබෑමට බලය දෙනු ලබන තෙක්, කිසිම තැනැත්තකුට එම නැවට නැඟීමට ඉඩ නොදිය යුතු වන අතර ඒ කිසිම සතකු හෝ ඒ නැව් බඩු ගොඩබෑම හෝ ගොඩබෑමට අවසරදීම හෝ නොකළ යුතු ය. ගොඩබෑම.

28. (1) ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන යම් සතකු නියමිත ස්ථානයක දී, නියමිත තැනැත්තන් විසින්, කලින් කල ඉදිරිපත් කරන ලෙස නියම කිරීම සුදුසු යයි අධ්‍යක්ෂවරයා විසින් අදහස් කරනු ලැබ, එසේ නියම කරනු ලැබුවහොත් මිස, ඒ සතා තිස් දිනක අවම කාලසීමාවක් නිරෝධායනය කරනු ලැබීමට යටත් වන්නේ ය. නිරෝධායනය.

(2) (අ) නිරෝධායනයේ තැබීමට නියම කරනු ලැබූ යම් සතකුට ප්‍රමාණවත් ආහාර සහ ජලය සැපයීම; සහ

(ආ) නිරෝධායනයෙහි තබනු ලද සෑම සතකුට ම ප්‍රතිකාර කිරීම සඳහා සහ එකී සතා නඩත්තු කිරීම සඳහා සහ නිරෝධායනයෙහි දී මිය යන යම් සතකුගේ මළකුණ බැහැර කිරීම සඳහා ද දරනු ලබන සියලු වියදම් දැරීම ආනයනකරුගේ කාර්යය වන්නේ ය.

(3) නියමිත ප්‍රමාණයක වූ නිරෝධායන ගාස්තුවක් ගෙවන ලෙස සෑම ආනයනකරුවකුට ම නියම කරනු ලැබිය යුතු ය.

(4) නිරෝධායනයට යටත් යම් සතකු රෝගී බව දැනගතහොත් එම සතා විනාශ කිරීමට සහ උගේ මළකුණ බැහැර කිරීමට අධ්‍යක්ෂවරයා විසින් නියම කරනු ලැබීම නීත්‍යනුකූල වන අතර එම සතා සහ උගේ මළකුණ විනාශ කිරීමට හා බැහැර කිරීමට සහ ඒ සම්බන්ධයෙන් 9 වන වගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ වන්නේ ය.

29. (1) නිරෝධායන ස්ථානයට යාබද ප්‍රදේශයක් මේ පනතේ කාර්ය සඳහා ආරක්ෂක කලාපයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම යෝග්‍ය යයි අධ්‍යක්ෂවරයා අදහස් කළහොත්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීමක් මගින් අධ්‍යක්ෂවරයා විසින් එසේ ප්‍රකාශයට පත් කරනු ලැබීම නීත්‍යනුකූල වන්නේ ය. ආරක්ෂක කලාපය.

(2) එබඳු සෑම දැන්වීමක ම, එම ආරක්ෂක කලාපයේ සීමා සහ ඒ එක් එක් ඒකකය පිහිටුවනු ලබන්නේ කවර දිනයක සිට ද සහ කවර කාල පරිච්ඡේදයක් සඳහා ද යන වග සඳහන් විය යුතු ය.

(3) ආරක්ෂක කලාපය, එම දැන්වීමේ සඳහන් කාලසීමාව තුළ, සියලු වාහන සහ සතුන් සඳහා වසා තැබිය යුතු ය. එම කාලසීමාවේ එම ආරක්ෂක කලාපයට ඇතුල්වීමට බලය නොලත් කිසිම තැනැත්තකුට ඉඩ දෙනු නොලැබිය යුතු ය.

සංක්‍රමණික සතුන්.

30. ශ්‍රී ලංකාවෙන් පිටත වූ යම් වරායකට ප්‍රේෂණය කරනු ලැබ සිටින සතුන් සහිත යම් නැවක් ශ්‍රී ලංකාවේ යම් වරායක් හරහා ගමන් කරන කවර හෝ අවස්ථාවක, එම නැව ශ්‍රී ලංකාවේ වරායට පැමිණෙන දිනට අවම වශයෙන් දින දහයකටවත් කලින්, එම කාරණය අධ්‍යක්ෂවරයා වෙත හෝ ඔහු විසින් බලය දෙන ලද යම් නිලධරයකුට දැනුම්දීම ඒ නැවේ ශ්‍රී ලංකාවේ අනුයෝජිතගේ කාර්යය වන්නේ ය.

පශු වෛද්‍ය ඖෂධ සහ පශු වෛද්‍ය ජෛව නිෂ්පාදන ආනයනය කිරීම.

31. (1) යම් පශු වෛද්‍ය ඖෂධයක් හෝ පශු වෛද්‍ය ජෛව නිෂ්පාදනයක් ආනයනය කරන තැනැත්තා, එම ඖෂධයේ හෝ ජෛව නිෂ්පාදනයේ ආරක්ෂා සහිත බව හා තත්ත්වය සහතික කරමින්, එම නිෂ්පාදනය ගෙන එනු ලබන්නේ යම් රටකින් ද ඒ රටේ ප්‍රධාන පශු ශල්‍ය වෛද්‍යවරයා විසින් හෝ, ඔහු විසින් බලය දෙන ලද පශු ශල්‍ය වෛද්‍යවරයකු විසින් දෙන ලද සහතිකයක් ඉදිරිපත් කළහොත් මිස, ඒ තැනැත්තාට ඒ පශු වෛද්‍ය ඖෂධය හෝ පශු වෛද්‍ය ජෛව නිෂ්පාදනය ආනයනය කිරීම සඳහා වූ අවසර පත්‍රයක් නිකුත් කරන ලෙස අධ්‍යක්ෂවරයා විසින් නිර්දේශ නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ සහතිකය, මෙහි දෙවන උපලේඛනයේ දැක්වෙන ආකෘතියට අනුකූල විය යුතු ය.

පශු වෛද්‍ය ඖෂධ පාලන අධිකාරිය.

32. (1) (මෙහි මින්මතු "අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන) පශු වෛද්‍ය ඖෂධ අධිකාරියක් විය යුතු අතර එය පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය :—

(අ) තත් කාලයේ අධ්‍යක්ෂ ධුරය දරන තැනැත්තා ; ඔහු අධිකාරියේ සභාපති විය යුතු ය ;

(ආ) දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්තව සිටින පශු වෛද්‍යවරුන් අතරින් අධ්‍යක්ෂවරයා විසින් පත් කරනු ලබන එක් සාමාජිකයෙක් ; ඔහු අධිකාරියේ රෙජිස්ට්‍රාර්වරයා විය යුතු ය ;

(ඇ) පහත දැක්වෙන විෂයවල පුළුල් දැනුමක් හා පළපුරුද්දක් ඇති තැනැත්තන් වශයෙන් අමාත්‍යවරයාට පෙනී යන තැනැත්තන් අතරින් අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන සාමාජිකයන් හය දෙනෙක් ;

(i) රාජ්‍ය හා පෞද්ගලික අංශවල සායන වෘත්තිය.

(ii) ක්ෂුද්‍රජීවී විද්‍යාව සහ ප්‍රතිශක්ති විද්‍යාව.

(iii) පරපෝෂිත විද්‍යාව.

(iv) ඖෂධ වේදය.

(v) පෝෂණය.

(vi) ප්‍රජනක කායික විද්‍යාව සහ අන්තරාසර්ග විද්‍යාව.

(ඇ) එක් සාමාජිකයකු දේශීය පශු වෛද්‍ය ඖෂධ සහ පශු වෛද්‍ය ජෛව නිෂ්පාදන නිෂ්පාදකයන් නියෝජනය කිරීම සඳහා අමාත්‍යවරයා විසින් පත් කරන ලද පශු වෛද්‍යවරයෙක් විය යුතු ය;

(ඈ) විශේෂඥ අවවාද හා උපදෙස් ලබා ගැනීමේ කාර්යය සඳහා අවශ්‍ය වන කවර හෝ අවස්ථාවක නිශ්චිත කාල පරිච්ඡේද යක් සඳහා අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන සාමාජිකයන් සංඛ්‍යාවක්.

(2) (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ පත් කරන ලද රෙජිස්ට්‍රාර්වරයා හෝ (ඇ) ඡේදය යටතේ නම් කරන ලද යම් සාමාජිකයකු මිය යාම හෝ ඉල්ලා අස්වීම නිසා කලින් ධුරය හිස් කළහොත් හෝ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් ඉවත් කරනු ලැබුවහොත් මිස අවස්ථෝචිත පරිදි එම පත්වීමේ හෝ නම් කිරීමේ දිනයේ සිට අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු ය:

එසේ වුව ද මියයන, ඉල්ලා අස්වන හෝ වෙනත් ක්‍රමයකින් ධුරය හිස් කරන පත් කළ හෝ නම් කළ සාමාජිකයකු වෙනුවට පත් කරනු ලබන සාමාජිකයකු, ඔහු කලින් ධුරය හිස් කළහොත් මිස, ඔහු අනුප්‍රාප්ත වනු සාමාජිකයාගේ නොඉකුත් ඇති ධුර කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

(3) අධ්‍යක්ෂවරයා හැර කවර හෝ සාමාජිකයකු, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් කිසිදු හේතුවක් නොදක්වා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(4) අධ්‍යක්ෂවරයා හැර, කාලය ඉකුත්වීම නිසා ධුරය හිස් කරන යම් සාමාජිකයෙකුට නැවතත් පත්වීම සඳහා සුදුසුකම් ඇත්තේ ය.

(5) යම් පත් කළ සාමාජිකයකු විසින් තමා ඉල්ලා අස්වන බවට අමාත්‍යවරයා වෙත යොමු කළ ලිපියක් මගින් කවර හෝ අවස්ථා වක නම් ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර අමාත්‍යවරයා විසින් එය ලියවිල්ලක් මගින් භාරගත් විට එම ඉල්ලා අස්වීම ක්‍රියාත්මක විය යුතු ය.

(6) යම් සාමාජිකයකු රෝගාතුරවීම හෝ වෙනත් අබලතාවක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා යම්කිසි කාලසීමාවක් තම ධුරයෙහි කාර්ය ඉටුකිරීමට තාවකාලිකව අපොහොසත් වුවහොත් එම සාමාජිකයා වෙනුවෙන් ක්‍රියා කිරීම සඳහා වෙනත් තැනැත්තකු අමාත්‍යවරයා විසින් නම් කරනු ලැබිය හැකි ය.

(7) සාමාජිකයන්ගේ පාරිශ්‍රමිකය සහ එය ගෙවීමේ ක්‍රමය මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් තීරණය කළ හැකි ය.

(8) අධිකාරියේ බලතල, කාර්ය සහ කර්තව්‍ය පහත දැක්වෙන පරිදි විය යුතු ය :—

(අ) පශු වෛද්‍ය ඖෂධ සහ පශු වෛද්‍ය ජෛව නිෂ්පාදන නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, අපනයනය කිරීම, විකිණීම සහ භාවිත කිරීම විෂයයෙහි පාලනය ක්‍රියාත්මක කිරීම ;

(ආ) පශු වෛද්‍ය ඖෂධ සහ පශු වෛද්‍ය ජෛව නිෂ්පාදන සතුන් සම්බන්ධයෙන් කාර්යක්ෂම සහ ප්‍රවේශම් සහිත ලෙස භාවිත කෙරෙන බවට වගබලා ගැනීම ;

(ඇ) පශු වෛද්‍ය ඖෂධ සහ පශු වෛද්‍ය ජෛව නිෂ්පාදන නිෂ්පාදනය කිරීම හෝ ආනයනය කිරීම සඳහා බලපත්‍ර ප්‍රදානය කළ යුතු ද යන වග තීරණය කිරීම ;

(ඈ) අමාත්‍යවරයා විසින් උපදෙස් සඳහා අධිකාරියට යොමු කරනු ලබන යම් කාරණයක් පිළිබඳව හෝ අමාත්‍යවරයාට දැන්විය යුතු යයි අධිකාරිය විසින් අවශ්‍ය යයි අදහස් කරනු ලබන වෙනත් යම් කාරණයක් පිළිබඳව අමාත්‍ය වරයාට උපදෙස් දීම ;

(ඉ) පශු වෛද්‍ය ඖෂධ හෝ පශු වෛද්‍ය ජෛව නිෂ්පාදන පරීක්ෂා කිරීම හෝ වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය යයි අධිකාරිය විසින් අදහස් කරනු ලබන පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම ;

(ඊ) පශු වෛද්‍ය ඖෂධ සහ පශු වෛද්‍ය ජෛව නිෂ්පාදන ප්‍රවේශම්කාරී සහ කාර්යක්ෂම ලෙස භාවිත කිරීම පිළිබඳව වූ තොරතුරු බෙදාහැරීම ;

(උ) බලපත්‍ර නිකුත් කර ඇති හෝ බලපත්‍ර නිකුත් කිරීමට ඇති පශු වෛද්‍ය ඖෂධ සහ පශු වෛද්‍ය ජෛව නිෂ්පාදන පිළිබඳව පරීක්ෂණ පැවැත්වීම අවශ්‍ය යයි අධිකාරිය විසින් අදහස් කරනු ලබන කවර හෝ අවස්ථාවක එම පරීක්ෂණ පැවැත්වීම හෝ පැවැත්වීමට සැලැස්වීම.

33. (1) සත්ව ශුක්‍ර හෝ කලල රූපය ලබාගැනීමට පෙර මාස තුනක් වූ කාලසීමාව ඇතුළත ඒ ශුක්‍ර හෝ කලල රූප ලබාගත් සතා කිසියම් රෝගයකින් නොපෙළුනු බවට ද යම් ආසාදිත හෝ රෝගී සතකු හා සම්බන්ධ වී නොතිබුණු බවට ද සහතික කරමින්, ඒ ශුක්‍ර හෝ කලල රූපය ලබාගනු ලැබූ රටේ ප්‍රධාන පශු ශල්‍ය වෛද්‍යවරයා විසින් හෝ ඔහු විසින් බලය දෙන ලද පශු ශල්‍ය වෛද්‍යවරයකු විසින් නිකුත් කරන ලද සහතිකයක් ඒ ශුක්‍ර හෝ කලල රූප ආනයනය කිරීමට අපේක්ෂා කරන තැනැත්තා විසින් අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කරනු ලැබුවහොත් මිස, එසේ සත්ව ශුක්‍ර හෝ කලල රූප ආනයනය කිරීම සඳහා ඒ තැනැත්තාට අවසර පත්‍රයක් නිකුත් කරන ලෙස අධ්‍යක්ෂවරයා විසින් නිර්දේශ නොකළ යුතු ය.

ශුක්‍ර හෝ කලලරූප ආනයනය කිරීම.

(2) (1) වන උපවගන්තියේ සඳහන් සහතිකය මේ පනතේ තුන්වන උපලේඛනයේ දක්වා ඇති ආකෘතිය අනුව විය යුතු ය.

(3) සත්ව ශුක්‍ර හෝ කලල රූප ආනයනකරුවකු විසින්, ඒවා ලංකා වන දිනයට සවිස්තර පිරිසෙයින් දින හතකට වත් කලින්, එම ශුක්‍ර හෝ කලල රූප පැමිණෙන දිනය හා වරාය හෝ ස්ථානය අධ්‍යක්ෂවරයාට ලියවිල්ලකින් දැන්විය යුතු ය.

(4) යම් ආනයනය කරන ලද සත්ව ශුක්‍ර හෝ කලල රූප භාවිතා කිරීමෙන් ආසාදනය හා රෝග ඇති විය හැකි බව විශ්වාස කිරීමට අධ්‍යක්ෂවරයාට හැඟෙන හේතු තිබේ නම් එම ශුක්‍ර හෝ කලල රූප අධ්‍යක්ෂවරයා විසින් ආපසු ලබාගෙන, විනාශ කරනු ලැබීම නීත්‍යානුකූල වන අතර එම ශුක්‍ර හෝ කලල රූප විනාශ කිරීමට 9 වන වගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ වන්නේ ය.

(5) ආනයනය කරන ලද ශුක්‍ර හෝ කලල රූප භාවිතා කිරීමට අදහස් කරනු ලැබ ඇති සතුන් සහිත පට්ටිය පශු ශල්‍ය වෛද්‍යවරයකුගේ අධීක්ෂණය හා පාලනය යටතේ තැබීමට අධ්‍යක්ෂවරයා විසින් සැලැස්විය යුතු ය. එම ආනයනය කරන ලද ශුක්‍ර හෝ කලල රූප යොදා සතුන් සහිත පට්ටියේ යම් සතකුට ඒවා එසේ යෙදීමෙන් මාසයක් ඇතුළත රෝගයක් ඇති වුවහොත් ඒ බව අධ්‍යක්ෂවරයාට වාර්තා කිරීම ඒ පශු ශල්‍ය වෛද්‍යවරයාගේ කාර්යය වන්නේ ය.

(6) ආනයනය කරන ලද සත්ව ශුක්‍ර හෝ කලල රූප යෙදීම නිසා පට්ටියක ගබ්සා වීමක් හෝ අජීවී උපතක් සිදුවුවහොත්, එම සිද්ධිය පිළිබඳව නොපමාවම අධ්‍යක්ෂවරයාට හෝ බලයලත් නිලධරයාට දැන්වීම, එම පට්ටියේ අධීක්ෂණය හා පාලනය භාර පශු වෛද්‍ය නිලධරයාගේ කාර්යය වන්නේ ය.

34. (1) අධ්‍යක්ෂවරයාගේ නිර්දේශය මත ආනයනය අපනයන පාලක විසින් නිකුත් කරන ලද අවසර පත්‍රයක බලය යටතේ හැර, කිසිම තැනැත්තකු විසින් යම් සතකු, සත්ව නිෂ්පාදනයක්, පශු වෛද්‍ය ඖෂධයක්, පශු වෛද්‍ය ජෛව නිෂ්පාදනයක්, ශුක්‍ර හෝ කලල රූපයක් අපනයනය නොකළ යුතු ය.

අපනයනය.

(2) අපනයනකරු විසින්, අපනයනයට පෙර, බලයලත් නිලධරයකුගෙන් ලබාගත් සහතිකයක් අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කරන්නේ නම් මිස, යම් සතකු, සත්ව නිෂ්පාදනයක්, පශු වෛද්‍ය ඖෂධයක්, පශු වෛද්‍ය ජෛව නිෂ්පාදනයක්, ශුක්‍ර හෝ කලල රූපයක් අපනයනය කිරීමේ අවසර පත්‍රයක් නිකුත් කිරීම සඳහා අධ්‍යක්ෂවරයා විසින් නිර්දේශයක් නොකළ යුතු ය.

මේ වගන්තියේ කාර්ය සඳහා "බලයලත් නිලධරයා" යන්නෙන් අමාත්‍යවරයා විසින් තත්කාර්යය සඳහා බලය දෙන ලද පශු වෛද්‍ය නිලධරයකු අදහස් වේ.

(3) (2) වන උපවගන්තිය යටතේ වූ සහතිකය අවස්ථාවෝචිත පරිදි මෙහි දෙවන හෝ තුන්වන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට අනුකූල විය යුතු ය.

(4) සෑම අපනයනකරුවකු විසින් ම එවැනි යම් අපනයන කිරීමක් පිළිබඳව අධ්‍යක්ෂවරයාට යටත් පිරිසෙයින් එක් සතියක දැන්වීමක් කළ යුතු ය.

## IV වන කොටස

### සාමාන්‍ය කරුණු

වරදවල් සහ දඬුවම්.

35. (1) මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ එකී යම් විධිවිධානයක් යටතේ කරන ලද යම් නියමයක් කඩකරන හෝ ඊට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින හෝ මේ පනත යටතේ තමා වෙත පවරන ලද බලතල ක්‍රියාත්මක කිරීමේ දී යම් නිලධරයකුට ප්‍රතිරෝධය පාන හෝ බාධා කරන සෑම තැනැත්තෙක් ම වරදක් කරන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට, මාස හයක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමට හෝ රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකට හෝ ඒ දඩය හෝ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් වන්නේ ය.

(2) පුද්ගල මණ්ඩලයක් විසින් ඒ වරද කරනු ලැබූ අවස්ථාවක—

(අ) ඒ පුද්ගල මණ්ඩලය, සංස්ථාවක් වන්නේ නම්, ඒ සංස්ථාවේ සෑම අධ්‍යක්ෂවරයකුම, කළමනාකාරවරයකුම, ලේකම්වරයකුම හෝ නිලධරයෙකුම ; හෝ

(ආ) ඒ මණ්ඩලය ව්‍යාපාර ආයතනයක් වන්නේ නම්, ඒ ව්‍යාපාර ආයතනයේ සෑම හවුල්කරුවෙක් ම,

තමාගේ කැමැත්ත හෝ එකඟත්වය නොමැතිව ඒ වරද කරන ලද බව සහ ඒ වරද කිරීම වළක්වාලීම සඳහා තමා සියලු නිසි උද්යෝගයෙන් ක්‍රියා කළ බව ඔහු ඔප්පු කළහොත් මිස, ඒ වරද කර ඇත්තේ ය.

36. මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද නියෝග යටතේ යම් තැනැත්තකු විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි අදහස් කරනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව කිසිම සිවිල් නඩුවක් හෝ අපරාධ නඩුවක් හෝ වෙනත් නඩු කටයුත්තක් හෝ පවරනු නොලැබිය යුතු ය. සද්භාවයෙන් කරනු ලබන ක්‍රියා සඳහා ආරක්ෂාව.

37. (1) නියමිත කරුණු ලෙස මේ පනතින් නියම කර ඇති කරුණු සම්බන්ධයෙන් හෝ නියෝග සෑදීමට බලය දෙන ලද කරුණු සම්බන්ධයෙන් සහ විශේෂයෙන් පහත දැක්වෙන කරුණු සියල්ලම හෝ ඉන් යම් කරුණක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය:— නියෝග.

(අ) බලපත්‍රයක් සඳහා ඉල්ලීමක් කරනු ලැබිය හැකි ක්‍රමය සහ ආකාරය; සහ

(ආ) බලපත්‍රයක් නිකුත් කිරීම සහ අලුත් කිරීම සඳහා ගෙවිය යුතු ගාස්තු.

(2) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරන ලද දින සිට හෝ ඒ නියෝගයේ සඳහන් යම් පසු දිනයක සිට හෝ එය ක්‍රියාත්මක වන්නේ ය.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම, එය ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු හැකි ඉක්මණින්, අනුමතිය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත නොකරන ලද සෑම නියෝගයක් ම, ඒ යටතේ කලින් කරන ලද කිසිම දෙයක් පිළිබඳව වලංගු භාවයට හානියක් නොමැතිව, ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

(5) මෙහි පළමුවන උපලේඛනයේ නිශ්චිතව සඳහන් නොවන යම් සත්ව රෝගයක් මේ පනතේ කාර්ය සඳහා විශේෂිත රෝගයක් බව ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් ප්‍රකාශ කළ හැකි අතර මේ පනතේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඊට අදාළ විය යුතු ය.

38. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ— අර්ථ නිරූපණය.

"සතා" යන්නෙන් ගවයකු, මී හරකකු, බැටළුවකු, එළුවකු, ඌරකු, මත්ස්‍යයකු, අශ්වයකු, කොටළුවකු, බූරුවකු, බල්ලකු, බළලකු, කුරුල්ලකු, මී මැස්සකු, අදයක් වන අතර හෝ ගෘහාශ්‍රිතව හෝ ග්‍රහණයට ගෙන හෝ පාලනය යටතේ හෝ වෙනත් ආකාරයකින් හෝ තබාගනු ලැබුව ද වෙනත් යම් ගිලා හෝ වල් සතකු ඊට ඇතුළත් වේ;

"සත්ව නිෂ්පාදනය" යන්නට, මස්, කිරි, මාළු, බිත්තර, ලේ, සම, හිවිය, කෙස්, ලොම්, පිහාටු, අවමස්, අඟ, කුර සහ

සතෙකුගෙන් හටගන්නා, අමුවෙන් වූ, පිසින ලද හෝ සකස් කරන ලද වෙනත් යම් නිෂ්පාදනයක් අදහස් වේ;

"උචිත බලධරයා" යන්නෙන්—

(අ) නැව් තොටක් සම්බන්ධයෙන් වන විට 1979 අංක 51 දරන වරායවල් පිළිබඳ අධිකාරිය පනත යටතේ පිහිටුවන ලද වරාය අධිකාරිය; සහ

(ආ) ගුවන් තොටුපළක් සම්බන්ධයෙන් වන විට, 1982 අංක 2 දරන ගුවන් සංතරණ (විශේෂ විධිවිධාන) පනත යටතේ පත් කරන ලද අනුයෝජිතයකු සහ එවැනි අනුයෝජිතයකු පත් කරනු ලැබ නොමැති අවස්ථාවක, සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් වරයා අදහස් වේ;

"බලයලත් නිලධරයා" යන්නෙන්, මේ පනතේ කාර්ය සඳහා අධ්‍යක්ෂවරයා විසින් බලය දෙන ලද නිලධරයකු අදහස් වේ;

"මළකුණ" යන්නෙන්, යම් සතකුගේ මළකුණක් අදහස් වන අතර, මළකුණක යම් කොටසක් සහ සතකුගේ මස්, ඇට, සම, සිවිය, කුර, අඟ, අවමස් හෝ වෙනත් කොටසක් වෙන වෙනම හෝ නොඑසේව හෝ ඉන් යම් කොටසක් ඊට ඇතුළත් වේ;

"සංස්පර්ශක" යන්නෙන්, ස්පර්ශයෙන් සංක්‍රමණය වීම අදහස් වේ;

"අධ්‍යක්ෂවරයා" යන්නෙන්, සත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය අධ්‍යක්ෂවරයා අදහස් වේ;

"රෝගය" යන්නෙන්, පළමුවන උපලේඛනයේ ලැයිස්තු ගත කර ඇති, සතුන් හෝ කුරුල්ලන් අතර පැතිරෙන යම් ආසාදක හෝ සංස්පර්ශක රෝගයක් අදහස් වේ;

"මළමූත්‍රාදිය" යන්නෙන්, සතකුගෙන් හෝ උගේ මළකුණෙන් පිටවන මළමූත්‍ර හෝ වෙනත් යම් ද්‍රව්‍යයක් අදහස් වේ;

"ආහාර" යන්නට, හාල් නිවුඩු, තිරිඟු නිවුඩු, ධාන්‍ය පොතු හෝ මුහුදෙන් ප්‍රභවය ලත් එළවළු තෙල්, පුන්නක්කු හෝ සකස් කළ හෝ සකස් නොකළ සතුන්ට කෑම දීමේ දී පාවිච්චි කිරීමට අදහස් කළ හෝ පාවිච්චි කරන ශාක වලින් හෝ සතුන්ගෙන් ලබාගත් වෙනත් යම් ද්‍රව්‍යයක් ඇතුළත් වේ;

"මත්ස්‍යයා" යන්නට, සියළුම වර්ගවල මත්ස්‍යයන්, කකුළුවන්, ඉස්සන්, පොකිරිස්සන්, කැස්බෑවන්, පිසින ලද, ටින්වල අසුරන ලද, වේලන ලද, ලුණු අසුරන ලද හෝ ලුණු දමන ලද කරදිය මෙන්ම මිරිදිය මත්ස්‍යයන් ඇතුළත් වේ;

"සත්වාහාර" යන්නට, තෘණ, වියළි තෘණ, පිදුරු, එන්රැස්කළ පිදුරු හෝ අමු හෝ කල් තබාගත් ශාකවලින් ලබාගන්නා ලද වෙනත් යම් ද්‍රව්‍යයක් ඇතුළත් වේ;

"ආසාදක" යන්නෙන්, එක්සත්ත මගින් හෝ ආසාදක ස්‍රාවයන් හෝ සහ බහිර්ස්‍රාවයන්ගේ අප්‍රාණික වාහකවලින් සිදුවන දූෂණය මගින් හෝ ප්‍රේෂණය වීම අදහස් වේ;

"අතුරුණුව" යන්නට, පිදුරු, පොතු, ලීකුඩු සහ සතුන් නිදා ගැනීම සඳහා යොදාගනු ලබන වෙනත් යම් ද්‍රව්‍යයක් ඇතුළත් වේ;

"මස්" යන්නෙන්, අමු, පිසින ලද, සකස් කරන ලද, දුම් ගස්වන ලද, බදින ලද, ලුණු අතුරන ලද හෝ පිත්වල අසුරන ලද අවමස් ද ඇතුළු යම් සතකුගේ මළකුණ කිසි කෑමට සුදුසු යම් කොටසක් අදහස් වේ;

"අයිතිකරු" යන්නට, සතකු සම්බන්ධයෙන් වන විට, හවුල් අයිතිකරුවන් හෝ කුලියට හෝ බද්දට දෙන තැනැත්තකු හෝ අයිතිකරුවකු වෙනුවෙන් යම් සතකු භාරයේ තබා ගන්නා යම් තැනැත්තකු ඇතුළත් වේ;

"නිරෝධායන" යන්නෙන්, යම් සතකු, කුරුල්ලකු හෝ යම් භාණ්ඩයක් වෙන්කර අනිවාර්යයෙන් රඳවා තබාගැනීම අදහස් වේ;

"නිරෝධායන ස්ථානය" යන්නෙන්, නිරෝධායන කටයුතු කර ගෙන යනු ලබන යම් ගොඩනැගිල්ලක් හෝ ස්ථානයක් අදහස් වන අතර, පරීක්ෂා කිරීමේ ස්ථානයක් ද ඊට ඇතුළත් වේ;

"පශු වෛද්‍ය ජෛව නිෂ්පාදන" යන්නට, එන්නත්, රුධිර ද්‍රව ජීවත්වන හෝ මියගිය ක්ෂුද්‍ර ජීවීන් සහ සතුන්ගේ රෝග නිර්ණයේ දී, එම රෝගවලට ප්‍රතිකාර කිරීමේ දී හෝ එම රෝග වැළැක්වීමේ දී භාවිත කිරීමට අදහස් කෙරෙන ඒවායේ සාරය හෝ අතුරු නිෂ්පාදන ඇතුළත් වේ;

"පශු වෛද්‍ය ඖෂධය" යන්නට—

(i) (අ) සතකුගේ රෝග හෝ අසාමාන්‍ය ශාරීරික තත්වය හෝ එහි ලක්ෂණ නිර්ණයේ දී ඊට ප්‍රතිකාර කිරීමේ දී, ඒවා අඩු කිරීමේ දී හෝ වැළැක්වීමේ දී; සහ

(ආ) යම් සතකුගේ ඓන්ද්‍රිය කාර්ය උපයෝගි කර ගැනීමේදී, නිවැරදි කිරීමේ දී හෝ වෙනස් කිරීමේ දී

භාවිත කිරීම සඳහා නිෂ්පාදනය කරන ලද, විකුණන ලද, විකිණීමට ඉදිරිපත් කරන ලද හෝ භාවිත කිරීමට අදහස් කරන ලද යම් ද්‍රව්‍යයක් හෝ ද්‍රව්‍ය මිශ්‍රණයක්;

(ii) භාවිතය සඳහා සූදානමින් ඇත්තා වූ ද විශේෂ නාමක්

යටතේ හෝ ලාක්ෂණික ස්වරූපයකින් වෙළෙඳ පොළේ තබා ඇත්තා වූ ද, අයිතිය ප්‍රකාශිත සහ හිමිකාර සන්තක කිරීම වන්නා වූ ද, එක් ඖෂධයක් හෝ ඖෂධ සංයෝජනයක්

ඇතුළත් වේ;

"පශු ශල්‍ය වෛද්‍ය" යන්නෙන්, රජය විසින් සේවයෙහි නියුක්ත කරවන ලද පශු වෛද්‍ය නිලධරයකු අදහස් වේ;

"යාත්‍රාව" යන්නෙන්, කෙසේ බැඳුනාය වුවද, සතුන්, සත්ව නිෂ්පාදන ප්‍රවාහනය කිරීම සඳහා යොදා ගනු ලැබිය හැකි ජලයෙන් හෝ ගුවනින් සංතරණය වන වාහන ක්‍රමයක් අදහස් වේ.

ඉවත් කිරීම සහ අත් හැරීම.

39. (1) (470 වන අධිකාරය වූ) සංස්පර්ශක රෝග (සත්ව) ආඥාපනත මෙයින් ඉවත් කරනු ලැබේ.

(2) සංස්පර්ශක රෝග (සත්ව) ආඥාපනතේ කුමක් සඳහන් වුව ද, ඒ ආඥාපනත යටතේ සාදන ලදුව, මේ පනත ක්‍රියාත්මක කිරීමට පෙරාතුවම බලාත්මක වූ නියෝග, මේ පනතේ විධිවිධාන වලට අනනුකූල වන අවස්ථාවක සහ අනනුකූල වන තාක් දුරට හැර, මේ පනත යටතේ සාදන ලද නියෝග ලෙස සලකනු ලැබිය යුතු අතර, මේ පනත යටතේ සාදන ලද නියෝග මගින් ඒ නියෝග වෙනස් කරනු ලබන, සංශෝධනය කරනු ලබන හෝ පරිච්ඡින්න කරනු ලබනතුරු නොකඩව බලාත්මක විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

40. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පළමුවන උපලේඛනය [4 වන වගන්තිය]

සංස්පර්ශක රෝග

(i) ගවයින් සහ මීහරකුන්

ඇන්ත්‍රැක්ස්, රක්තාශ්‍රව, කාල ගාත්‍ර මාලෙල්ලොසිස්, ක්ෂය රෝගය, ජෝන් රෝගය (ජෝනීස් ඩිසීස්) සහ ස්පර්ශක බෝවීයින් ප්ලූරෝ-නියුමෝනියාව, ලෙප්ටොස්පිරෝසිස්, බෝවයින් ෆාර්සි, ට්‍රිපනසෝමියාසිස්, බෝවයින් ජෙනිටල් කැම්පිලෝබැක්ටීරියෝසිස්.

කුර හා මුඛ රෝගය රින්ඩර්පෙස්ට්, බෝවයින් වයිරල් ඩයරියා, මැලිග්නන්ට් කැටරල් උණ, වෙසිකියුලර් ස්ටොමැටයිටිස්, ලම්පි චර්ම රෝග, ඉන්ෆෙක්ෂස් බෝවයින් රයිනොට්‍රැකියයිටිස් (අයිබීආර්/අයිපීවී) ඉන්ෆෙක්ෂස් පස්ටියුලර් වල්වෝවැජිනයිටිස්, බෝවයින් වයිරල් ලියුකෝසිස්,

ට්‍රිපනෝසෝමියාසිස්, ට්‍රයිකොමොනියාසිස්, බැබිසියෝසිස්, ඇනප්ලාස්මෝසිස්, තයිලේරියෝසිස්.

වෙරබල් ප්ලසි (හයිපර්ඩර්මා බෝවිස සහ) ඩිලීනේටම් ඩර්මටොබියෝසිස්.

(ii) බැටළුවන් සහ එළුවන්

ඇන්ත්‍රැක්ස්, පැස්චරෙල්ලෝසිස්, බෲසෙල්ලෝසිස්, ක්ෂය රෝගය, සංස්පර්ශක කැප්‍රයින් ප්ලූරෝනියුමෝනියාව,

කුර සහ මුඛ රෝගය, රින්ඩර්පෙස්ට්, වෙසිකියුලර් ස්ටෝමටයිටිස්, ගෝප පරිගෙ පස්චියුලර් ඩර්මටයිටිස්, නිල ජිව්හා, මීඩි (විස්නා), ටොක්සොප්ලාස්මෝසිස්, ස්ක්‍රේපි, බැක්ටීරියා පෙස්ට් ඩෙස් පෙටිට්ස් රුමිනන්ට්ස් (පීපීආර්) බැටළු වසූරිය, එළු වසූරිය.

ට්‍රිපැනොසෝමියෝසිස්, ඩර්මැටොමයිකෝසිස්.

(iii) ඌරන්

ඇන්ත්‍රැක්ස්, පැස්චරෙල්ලෝසිස්, බෲසෙල්ලෝසිස්, ක්ෂය රෝගය, ස්වයින් එරිසිපෙලස්.

කුර සහ මුඛ රෝගය, වෙසිකියුලර් ස්ටෝමටයිටිස්, වෙසිකියුලර් පෙක්සැන්තිමා, ක්ලැසිකල් ස්වයින් ෆීවර්, ඇෆ්රිකන් ස්වයින් ෆීවර්, ඔජෙස්කි රෝගය, ඇට්‍රොෆික් රයිනයිටිස්, ස්වයින් වෙසිකියුලර් රෝගය, ටෙෂන් රෝගය, ශ්ලේෂ්ම ස්ථිර ආන්ත්‍රික ප්‍රදාහය සහ ජපන් බී එන්සෙපලයිටිස්,

ට්‍රිපැනොසෝමියෝසිස්, ඩර්මැටොමයිකොසිස්.

(iv) බල්ලන් සහ බළලුන්

පර්වෝ වයිරස් ආසාදනය, ෆිලයින් එන්ටරයිටිස්, ජල භීතිකා රෝගය, ඩර්මටොමයිකෝසිස්.

(v) කුකුළු, තාරා ආදී සත්තු

පුල්ලෝරම් රෝගය, කුකුළු උණසන්නිපාතය, කුකුළු කොලරාව, ඒවියන් ක්ෂය රෝගය.

කුකුළු වසංගතය, නිව්කාසල් රෝගය (රානිකට්), මාරෙක් රෝගය, ඒවියන් ලියුකෝසිස්, ගම්බෝරෝ රෝගය, ආසාදක ඒවියන් එන්සෙපලොමයිලයිටිස්, ආසාදක ලැරින්ගොට්‍රැකියයිටිස්, ඒවියන් ආසාදක බ්‍රොන්කයිටිස්, ඩක් වයිරස් එන්ටරයිටිස් (තාරා වසංගතය), කුකුළු වසූරිය, මයිකොප්ලාස්මෝසිස්.

(vi) අශ්වයින්

ඇන්ත්‍රැක්ස්, ග්ලැන්ඩර්ස්, අප්‍රිකානු අශ්ව රෝගය, ආසාදක අශ්ව එන්සෙපලොමයිලයිටිස්. වෙසිකියුලර් ස්ටෝමටයිටිස්, ට්‍රිපැනොසෝමියෝසිස්, එපිසූටික් වසා වාහිනී ප්‍රදාහය, අශ්ව ආසාදක නීරක්තය, ජපන් බී එන්සෙපලයිටිස්

(vii) මත්ස්‍යයන්

ආසාදක අග්න්‍යාශයික විපන්තය.

(viii) මීමැස්සන්

ෆවුල් බෲඩ්, වැරෝවසිස්.

දෙවන උපලේඛනය

[22(2), 31(2) සහ 34 (3) වන වගන්ති]

ජාත්‍යන්තර වෙළඳාම සඳහා අදහස් කරන ලද සත්ව නිෂ්පාදන පශු වෛද්‍ය ඖෂධ හෝ පශු වෛද්‍ය ජෛව නිෂ්පාදන සඳහා වූ ආනයන/අපනයන සහතිකය

1. අපනයන/ආනයනය කරන රට:———.

2. අපනයනකරුගේ නම:———.

3. අපනයනකරුගේ ලිපිනය:———.

4. සතුන්ගේ ශුක්‍රවල/කලලයන්ගේ ප්‍රභව ස්ථානය:———.
මූල ස්ථානය: ———,

(i) සත්ව නිෂ්පාදනය/පශු වෛද්‍ය නිෂ්පාදනය/පශු වෛද්‍ය නිෂ්පාදන හඳුනාගැනීම:———.

1. සත්ව නිෂ්පාදනය/පශු වෛද්‍ය නිෂ්පාදනය/පශු වෛද්‍ය නිෂ්පාදන වර්ගය :——.

2. ඇසුරුමේ වර්ගය :——.

3. ඇසුරුම් සංඛ්‍යාව :——.

4. ශුද්ධ බර :——.

(ii) සත්ව නිෂ්පාදනයේ මූල ද්‍රව්‍යය :——.

1. අනුමත ඝාතනාගාරයේ (ඝාතනාගාරවල) ලිපිනය (ලිපිනයන්) ——.

2. අනුමත කැපීමේ/සකස් කිරීමේ ආයතනයේ (ආයතනවල) ලිපිනය/ලිපිනයන් :——.

(iii) සත්ව නිෂ්පාදනයේ/පශු වෛද්‍ය නිෂ්පාදනයේ/පශු වෛද්‍ය ජෛව නිෂ්පාදනයේ ගමනාන්තය :——.

1. ගමනාන්ත රට :——.

2. ඔහු ලබන්නාගේ නම සහ ලිපිනය :——.

3. ප්‍රවාහන ස්වභාවය සහ ක්‍රමය :——.

(iv) සුවදායකත්වය සහතික කිරීම

පහත අත්සන් කරන ලද බලයලත් පශු වෛද්‍යවරයා මෙසේ සහතික කරයි :—

1. ඉහත සඳහන් සත්ව නිෂ්පාදනය, ඒ සුව නිෂ්පාදනයම අනුමත කරන ලද ඝාතනාගාරවල ඝාතනය කරන ලද සතුන්ගෙන් ලබාගත් බව සහතික කරමින් මුද්‍රා තබනු ලැබේ.

2. සත්ව* නිෂ්පාදනය/නිෂ්පාදන මනුෂ්‍ය පරිභෝජනය සඳහා සුදුසු යයි සලකනු ලැබේ.

3. සත්ව නිෂ්පාදනය අනුමත *කැපීමේ/සකස් කිරීමේ ආයතනවල* කපා/සකස් කරනු ලැබ ඇත.

4. සත්ව නිෂ්පාදනය බෝවන රෝග නොමැති රාජ්‍යයකින් ගෙන්වනු ලැබේ.

5. පශු වෛද්‍ය ඖෂධය/පශු වෛද්‍ය ජෛව නිෂ්පාදනය සතුන් සඳහා භාවිත කිරීමට සුදුසු වන්නේය.

6. වෙනත් යම් අදාළ විස්තර :——.

බලයලත් පශු වෛද්‍යවරයාගේ අත්සන.

———————

(අපනයනය කරන රට) පශු වෛද්‍යවර යාගේ නම සහ ලිපිනය :——.

නිල මුද්‍රාව.

දිනය :——

*(නොගැලපෙන වචන කපා හරින්න)

## තුන්වන උපලේඛනය

[26 (2), 33 (2) සහ 34 (3) වන වගන්ති]

### සතුන් සහ සතුන්ගේ රේතස් හෝ කලල ආනයනය කිරීම සඳහා සත්ව සනීපාරක්ෂක සහතිකය.

1. අපනයනය කරන/ආනයනය කරන රට :———.

2. අපනයනකරුගේ නම :———.

3. අපනයනකරුගේ ලිපිනය :———.

4. සතුන්ගේ රේතස්වල/කලලයන්ගේ ප්‍රභව ස්ථානය :———.

(i) සත්ව හඳුනා ගැනීම (ජීවී සතුන් ආනයනය කිරීම/අපනයනය කිරීම සම්බන්ධයෙන් වන විට)

1. හඳුනා ගැනීමේ අංකය හෝ සලකුණ :———.
2. සත්ව විශේෂය :———.
3. සත්ව වර්ගය :———.
4. ගැහැණු පිරිමි බව :———.
5. වයස :———.

(ii) දායක සතා පිළිබඳ විස්තර (රේතස් හෝ කලල ආනයනය කිරීම/අපනයනය කිරීම සම්බන්ධයෙන් වන විට) :

1. සත්ව විශේෂය :———.
2. සත්ව වර්ගය :———.
3. හඳුනා ගැනීම :———.
4. උපන් දිනය :———.
5. උපන් ස්ථානය :———.
6. ඒ1/කලල ප්‍රතිරෝධනය කිරීමේ කාර්ය සඳහා සතා අනුමත කළ දිනය :———.

(iii) රේතස්/කලල පිළිබඳව විස්තර

1. ලබාගත් දිනය සහ වේලාව :———.
2. රේතස්/කලල ප්‍රමාණය සහ ඇසුරුම :———

(iv) සතාගේ /රේතස්වල/කලලයන්ගේ ගමනාන්තය

1. ගමනාන්ත රට :———.
2. ඔවුන් ලබාගන්නාගේ නම සහ ලිපිනය :———.
3. ප්‍රවාහන ස්වභාවය හා ක්‍රමය :———.

(v) සනීපාරක්ෂක තොරතුරු

පහත අත්සන් කරන ලද බලය ලත් පශු වෛද්‍යවරයාගේ සහතිකය පහත දැක්වේ :

(අ) ජීවී සත්වයකු ආනයනය කිරීම/අපනයනය කිරීම සම්බන්ධයෙන් වන විට ;

(i) ඉහත විස්තර කරන ලද සත්වයා වෛද්‍ය පරීක්ෂා කරන ලදුව, බෝවන රෝග ලක්ෂණ කිසිවක් පෙන්නුම් නොකෙරේ.

(ii) අපනයනය කිරීමට පෙරාතුව වූ තුන් මාස කාලයේ සතා රෝගී සතුන් සමග ගැටී නැත.

(iii) සත්ත්ව ප්‍රතිශක්තීකරණය කරනු ලැබ ඇත්තේ :

(අ) .........වන දින .........සම්බන්ධයෙනි.

(ආ) ......... වන දින ......... සම්බන්ධයෙනි.

(ඇ) ......... වන දින ......... සම්බන්ධයෙනි.

(ඈ) ......... වන දින ......... සම්බන්ධයෙනි.

(ඉ) ......... වන දින ......... සම්බන්ධයෙනි.

(iv) සතුන් අපනයනය කළ හෝ කරන ස්ථානය හෝ ගොවිපළ අනුමත ස්ථානයක් හෝ ගොවිපලක් වන අතර එය සහතිකය නිකුත් කිරීමට පෙර මාස තුනක කාලයක් රෝගවලින් තොරව පැවත ඇත.

(v) සුදු කොහොළු/සතා රෝග සම්බන්ධයෙන් පරීක්ෂා කරන ලදී.

(ආ) රේතස් හෝ කලල ආනයනය කිරීම/අපනයනය කිරීම සම්බන්ධයෙන් වන විට :

(i) රේතස්/කලල ලබාගත් දිනයේ රෝග චිකිත්සක ලක්ෂණ කිසිවක් ප්‍රදාන කාරක සතාගෙන් පෙන්නුම් නොකෙරිණි.

(ii) රේතස්/කලල ලබාගැනීමට මාස තුනක කාලයකට පෙරාතුව, දායක සතා රෝගී සතුන් සමග ගැවසී නැත.

(ඇ) විශේෂ වැදගත්කමක් ඇති වෙනත් යම් විස්තර:

.................

බලයලත් පශු වෛද්‍යවරයාගේ අත්සන.
අපනයන රට

බලයලත් පශු වෛද්‍යවරයාගේ නම
සහ ලිපිනය.

.......................
.......................
.......................

දිනය :——.

*(අදාළ නොවන වචන කපා හරින්න.)

[illegible]
[illegible] 15 දිනට පෙර [illegible]
[illegible]